
**දෙවන වාර පරීක්ෂණය - 2020 - ඉන්දියා ඉතිහාසය.**
**පිළිතුරු 12 - ශ්‍රේණිය 1 කොටස**

| | | | |
|---|---|---|---|
| (01) - 3 | (11) - 4 | (21) - 3 | (31) - 5 |
| (02) - 4 | (12) - 3 | (22) - 3 | (32) - 4 |
| (03) - 4 | (13) - 2 | (23) - 2 | (33) - 1 |
| (04) - 4 | (14) - 3 | (24) - 3 | (34) - 2 |
| (05) - 5 | (15) - 4 | (25) - 3 | (35) - 3 |
| (06) - 4 | (16) - 2 | (26) - 3 | (36) - 2 |
| (07) - 5 | (17) - 3 | (27) - 2 | (37) - 1 |
| (08) - 4 | (18) - 5 | (28) - 4 | (38) - 4 |
| (09) - 4 | (19) - 4 | (29) - 4 | (39) - 3 |
| (10) - 3 | (20) - 5 | (30) - 4 | (40) - 5 |

(ලකුණු 40)

**<u>11 පත්‍රය - පිළිතුරු</u>**



## II පත්‍රය

01. සිතියම - සිතියම ලකුණු කර ඇති ආකාරයට අනුව ලකුණු ලබාදෙන්න. (ල. 12)

### B කොටස

02. දේශීය සාහිත්‍ය මූලාශ්‍ර
* ආගමික - වෛදික සාහිත්‍ය, ඍග් වේදය, පශ්චාත් වෛදික යුගයේදී ලියැවුණු වේද, බ්‍රාහ්මණ ආරණ්‍යක, උපනිෂද්, පුරාණ වේදාංග, උපවේද හා සූත්‍ර.
* බ්‍රාහ්මණ ග්‍රන්ථ : ආරණ්‍යක ග්‍රන්ථ
* බෞද්ධ ග්‍රන්ථ - ජෛන සාහිත්‍ය, ලෞකික මූලාශ්‍ර ග්‍රන්ථ
* ඓතිහාසික ග්‍රන්ථ - වෙනත් සාහිත්‍ය ග්‍රන්ථ
* සංගම් සාහිත්‍ය -නාට්‍ය ග්‍රන්ථ, ව්‍යාකරණ ග්‍රන්ථ
* කාව්‍ය ග්‍රන්ථ - දේශපාලන න්‍යාය ග්‍රන්ථ, වෙනත් න්‍යාය ග්‍රන්ථ.
* වීර කාව්‍යයන් - ආදිය විස්තර කරන්න. (ල. 16)

03. (i) ඉන්දියාවේ බාහිර පිහිටීම.
* මධ්‍ය ආසියාවෙන් වෙන්ව පිහිටීම. * අක්ෂාංශ හා දේශාංශගත පිහිටීම.
* උපමහාද්වීපයක් ලෙස පිහිටීම.
(ii) ඉන්දියාවේ අභ්‍යන්තර පිහිටීම.
* කඳු වැටි. * දුර්ග මාර්ග * කාන්තාර හා සානු. * ගංගා * වරායන් ආදිය පිළිබඳ විස්තර කරන්න. (ල. 16)

04. පරිහානිය හා බිඳ වැටීම *
* ක්‍රි.පූ. 3500 දී මත ආරම්භ වී හරප්පා සභ්‍යත්වය ක්‍රි.පූ. 1650 දී පමණ පරිහානිය ආරම්භ වී ක්‍රි.පූ. 1500 දී පමණ මුලුමනින්ම බිඳ වැටුණු බව.
* ක්‍රි.පූ. 1500 දී පමණ එල්ල වූ ආර්‍ය ආක්‍රමණ.
* දියෙහි ගිලී මියගිය බවට සාධක හමුවීම.
* දේශගුණික විපර්යාස මගින් ජලචක්‍රය අක්‍රමවත්වීම හා කාන්තාරික දේශගුණයක් ඇතිවීම නිසා ජන ජීවිතය බිඳ වැටීම.
* ගංවතුර තර්ජන හේතුවෙන් ජන ජීවිතට අඩාල වීම.
* ශිෂ්ඨාචාරයට අයත් ප්‍රධාන නගර අවසානකාලය වන විට හදිසි ගිනිගැනීම්වලට ලක්වී ඇති බව.
* මුලින්ම හරප්පාව බිඳ වැටුණු පසු මොහොන්ජොදාරෝව, ලෝතාල් 1750 දී රබීගර්හි 1650 දීද, බිඳ වැටීමෙන් ශිෂ්ටාකාරය බිඳ වැටුණු බව. (ල. 8)

05. වෛදික යුගයේ ඉන්දියාවේ ආර්‍ය ජනාවාස පිහිටුවීම.
* ආර්යයන්ගේ මුල්බිම පිළිබඳ නිශ්චිත මතයක් ඉදිරිපත් වී නැත.
* එහෙත් පුරා විද්‍යාඥයෝ එකතු වී ආර්යයින්ගේ මුල් භූමිය පිළිබඳ විවිධ මත ඉදිරිපත් කර ඇත.
* දකුණු රුසියාවේ ස්ටෙප්ස් පෙදෙසින් සංක්‍රමණය වූ බව.
* බොහිටියාවේ හංගේරියන් තැන්න මුල් භූමිය බව.
* ආර්යයන් ඉන්දීයයන් බව. * කාශ්මීරය හා හිමාලය ආර්යන්ගේ මුල් භූමිය බව.
* ඍග්වේදය හා ඉරාන පාරම්පරික අවස්ථාවන්ට අනුව ආර්යයන් ඉංදියාවට පැමිණීමට පෙර ඉන්දු - ඉරානීය ජනයා සමග එක්ව ඉරානය අවට ප්‍රදේශයේ ලැගුම්ගෙන සිටි බව.
* සුලු ආසියාවේ කැප්පඩෝසිය ප්‍රදේශයේ බෝඝස්කෝයි සෙල්ලිපිය අනුව ආර්යයන් ක්‍රි.පූ. 15 වන සියවසේදී ඉන්දියාවට පැමිනි බව.
* ඍග් වේදයට අනුව ආර්යයන් ප්‍රථමයෙන් සප්ත සින්ධු ප්‍රදේශයේ ස්ථානගත වූ බව. පසුව මෙම ප්‍රදේශයේ පංජාබය නමින් හැඳින්වේ.
* භරත ගෝත්‍රයේ සුදාස් රජු පරුශ්නි හා ශුතුද්‍රි ගංගා අතර ලැගුම් ගෙන සිටි ගෝත්‍ර දහයකින් සමන්විත පෙරමුණක් සමග දසරාඥය නම් යුද්ධයකට පිවිසි බව.
* පසුව මෙම යුගය කොටස් දෙකකට බෙදුනු අතර,
1. ඍග් වෛදික යුගය - ඍග් වේදයෙන් තොරතුරු ලැබෙන යුගය ලෙසද,
2. පශ්චාත් වෛදික යුගය - යජුර්, සාම, අතර්වන්, බ්‍රාහ්මණ ආරක්ෂක, උපනිෂද්, පුරාණ වේදාංග, උපවේද සූ, ආදියෙන් තොරතුරු ලැබෙන යුගය. ආදී ලෙස විස්තර කරන්න. (ල. 16)

## C කොටස

06. පශ්චාත් යුගය දේශපාලන හා සමාජ දේශපාලන
* ඍග් වෛදික යුගයේ පැවති සරල දේශපාලන රටාව සංකීර්ණ තත්වයට පත්වීම.
* රජවරුන්ගේ බලපරාක්‍රමය වැඩිවීම.
* ඓතරේය බ්‍රාහ්මණගේ රජුන් වර්ග කර ඇත්තේ මේ ආකාරයට.
* සම්‍රාට් - පෙරදිගරජවරු * විරාට් - උතුරේ රජවරු
* භෝජ - දකුණේ රජවරු * රාජන් - මධ්‍යම ප්‍රදේශයේ රජවරු
* පාලකයන්ට දේවත්වය ආරෝපනය කිරීම.
* රාජ්‍යත්වය පාරම්පරිකව උරුමවීමේ සම්ප්‍රදායන් ඇතිවීම.
* අශ්වමේධ පරාජසූය වැනි මහා යාග හෝම චාරිත්‍ර හරහා පාලකයාගේ බලය ඉස්මතු කොට පෙන්වීම.
* ග්‍රාම. විශ්, ජන යනපාලන බෙදීම් තව දුරටත් පුළුල් වීම.
* සමිති හා සභා යනපාලන සංවිධාන තව දුරටත් පැවතඳනද. රජුට ඒවා යටත් වීම.
* රජුගේ පාලනයට සහාය දැක්වූ රත්නීන් හා රාජකර්ණ නමින් හැඳින්වූ නිලධාරීන් රැසක් සිටි බව ශතපති බ්‍රාහ්මණයේ සඳහන් වීම.

උදා: පුරෝහිත - රජුගේ උපදේශ
සේනානි - සෙන්පතිවරයා
ග්‍රාමනී - රජුගේ බලතල ගම්වල ක්‍රියාත්මක කරන්න.

* රජුට ගෙවිය යුතු බදු සිය නිෂ්පාදනයන්ගෙන් හෝ ගවයන්ගෙන් හෝ ගෙවිය යුතුවීම.
* අධිකරණයේ ප්‍රධානියා රජු බව.
* රජුගේ නියෝගයන් අනුව ග්‍රාමසීවරුන් විසින් මෙම දඩුවම් ක්‍රියාත්මක කරන ලදී.

සමාජ :
* ගෝත්‍රික සමාජය තවදුරටත් ස්ථාවර තත්වයට පත්වීම.
* බ්‍රාහ්මණයන්ගේ බලය බෙහෙවින් වර්ධනය වීම.
* ක්ෂත්‍රියයන් රාජ්‍ය පාලනයක්, වෛශයින් ගොවිතැන හා වෙළඳමෙන් ශුද්‍රයන් ඉහළ වර්ණවල සේවා කිරීමක් සිදුවීම.
* මෙකල සමාජය හැඩ ගැස්වූ තවත් සංකල්පයක් වන්නේ බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි යන වර්ණාශ්‍රම ධර්මයි.
* වර්ණාශ්‍රම ධර්ම අනුව ජීවිතයේ විවිධ අවස්ථාවලදී සිදුකළ සංස්කාරවිධි රැසක් පිළිබඳව සඳහන් වීම.
* කාන්තාවන්ට තිබූ නිදහස වේගයෙන් අහිමි වී යෑම.
* ඒක භාර්‍යා සේවනය  මෙන්ම බහු භාර්යා සේවනයද දක්නට තිබීම.
* ඇඳුම් පැලඳුම් ඍග් වෛදික යුගයේ පැවති තත්වයෙන් යම් යම් වෙනස්කම් සිදුවීම.
* විනෝදාංශ ලෙස ගායනය වාදනය, නර්තනය, දූ කෙළිය, රිය ධාවනය පැවතීම.
* ආහාර රටාව, ඍග් වෛදික යුගයේ පැවති ආකාරයට පවතී. (ල. 1)

07. (i) මගධ, කෝසල, වත්ස, අවන්ති (ල. 2)

(ii) වජ්ජි, මල්ල (ල. 2)

(iii) මුල් ජනපද යුගයේදී මගධය අභිබවා කෝසලය බලවත් වී සිටි අතර පහත සඳහන් හේතු සාධකවල බලපෑම නිසා මගධය බලවත්වීම.

<u>**භූ භෞතික සාධක :**</u> * සරු පසක් තිබීම, හිතකර දේශගුණයක් තිබීම. * දියුණු කෘෂි ආර්ථිකයක් ගොඩනැගීමට හැකිවීම. * ගංගා ගං නිම්නයේ ඔස්සේ විහිදුණු දීර්ඝ තැනිතලාව, ගමනාගමනයට මෙන්ම විවිධ ආර්ථික කටයුතුවලට වැදගත් වීම. * පංච මහා පර්වත ඇතුළු ස්වභාවික භූගෝලීය පිහිටීම් රැසක් මගින් මගධය ආරක්ෂා වී තිබීම. * ගංගා යමුනා, ඇතුලු අතු ගංගා රාශියක් තිබීම.
* වැඩිම වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශයක් වීම.

<u>**දේශපාලන :**</u> හර්යංක පරපුරේ බිම්බිසාර, අජාසත්ත වැනි කාර්යශූර උපක්‍රමශීලී පාලකයන් බිහිවීම. * ඔවුන් සිය රාජ්‍ය බලවත්කිරීම සඳහා නිරන්තරයෙන් උපාය - උපක්‍රමයක් යෙදීම. * මත්ස්‍යන්‍යාය, විවාහ සබඳතා, මිත්‍ර සබඳතා ආගමික සබඳතා ආදී විවිධ උපක්‍රම මගින් රාජ්‍ය පුළුල් කිරීම. * දක්ෂ උපදේශක අමාත්‍යවරුන් සිටීම.

ආර්ථික : * කෘෂි කර්මාන්තයට හා සත්ත්ව පාලනයට යෝග්‍ය පාරිසරික සාධක රැසක් මගධයේ දක්නට ලැබීම. * වාණිජ කටයුතු බාහිර හා අභ්‍යන්තර වශයෙන් ව්‍යාප්ත කිරීමට යෝග්‍ය මාර්ග පහසුව හා වරාය තොටුපල ආදිය පිහිටුවා තිබීම. * යපස්, රන්, මැණික් ඇතුලු වටිනා වාණිජ සම්පත් රැසක් මගධ රාජ්‍යයට අයත්ව තිබීම. * මගධය සතු වනාන්තර වලින් දැව, අලි ඇතුන්  ඇතුළු සම්පත් රැසක් ලබාගත හැකිවීම.

<u>**සමාජීය :**</u> වර්ණ ක්‍රමය තදින් ක්‍රියාත්මක නොවීම. * වෙළඳාම විවිධ කර්මාන්ත, කෘෂි කර්මාන්තය වැනි අංග මගින් ධනවත් වූ ප්‍රජාවක් බිහිවීම. * දේශපාලන බලය ලබා ගැනීමට ක්ෂත්‍රීය පදනම අවශ්‍ය නොවීම. * ගංගා යමුනා තැනිතලාව භූගෝලීය වශයෙන් බාධාවක් නොවීම නිසා සමාජ ඒකාබද්ධතාවයක් ගොඩ නැගීම. (ල. 4)

(vi) ක්‍රි.පූ. 6 වන සියවස උතුරු ඉන්දියාවේ දේශපාලන ක්ෂේත්‍රයේ පරිවර්තන යුගයකි. ඍග් වෛදික යුගයේදී ගෝත්‍ර වශයෙන් සංවිධානය වූ පිරිස් කණ්ඩායම් වශයෙන් පසුව නම් හා ජනපද පිහිටුවා ගන්නා අයුරු ක්‍රි.ව. 6 වන සියවසේදී පැහැදිලිව දක්නට ලැබිණි. මෙම යුගයේදී බිහිවූ මෙම පාලන සංවිධානය පාලන ඒකක සොළොස්මහා ජනපද නමින් හැඳින්විය. මේවා අංග, මගධ, කාසි, කෝසල ආදී වශයෙන් නම් කිරීම.
* මෙම සොලොස්මහා ජනපද වල ක්‍රියාත්මක වූ පාලන ක්‍රම ප්‍රධානවශයෙන් කොටස් දෙකකට බෙදීම.
1. රාජාණ්ඩු පාලන ක්‍රමය 2. සමූහාණ්ඩු පාලන ක්‍රමය
මේවායේ පාලන කටයුතු ආදිය පිළිබඳ විස්තර කරන්න. (ල. 8)

08. ඉන්දියාවේ වර්ධනය වූ නව ආගමික චින්තාවන් :
* ක්‍රි.පූ. 6 වන සියවස වන විට ඉන්දියාවේ ආගමික හා දාර්ශණික චින්තාවන් කෙරෙහි බලපෑ ඓතිහාසික පසුබිම.
* පශ්චාත් වෛදික යුගයේ බ්‍රාහ්මණයන් ගොඩනගා තිබූ ආගමික සංකල්ප විශාල පිරිසකගේ පීඩාවට හේතුවීම.
* යාඥා පැවැත්වීම, වර්ණාශ්‍රම ධර්ම ඇතුළු බොහෝ සංකල්ප නිසා බලවත් හිරිහැරයට ලක්වූ සමාජ කොටස් සිටීම.
* කර්ම මාර්ගය වෙනුවට ඥාණ මාර්ගය අනුගමනය කළ පිරිසක් බිහිවීම.
* මොවුන් ලෝකය, විශ්වය, ජීවිතය, ආත්ම, මරණය වැනි ගැඹුරු දාර්ශනික කථිකාවන් ඉස්මතු කොට සාකච්ඡාට බඳුන් කිරීම.
* ඒ අනුව ක්‍රි.පූ. හයවන සියවස වන විට බ්‍රාහ්මණ සම්ප්‍රදාය ඉක්මවා ගිය ආගමික හා දාර්ශනික චින්තාවන් රැසක් ඉස්මතු වීම. ඒවා නම්,
* බ්‍රාහ්මණවාදය. * ජෛනාගම. * බෞද්ධාගම්. * මේ වන විට ආගමික දෘෂ්ටීන් 62 ක් ඉන්දියාවේ පහළ වූ අතර. ඒ අතර ප්‍රසිද්ධියට පත් ශාස්තෘවරුන් 6 දෙනෙකු සිටි අතර ඔවුන් ෂට් ශාස්තෘවරුන් ලෙස හැඳින්වීම ආදී ලෙස විස්තර කරන්න. (ල. 16)

09. (i) කඳුවැටි - හිමාලයා, හින්දුකුෂ්, සත්පුර, වින්ධ්‍යා, සුලෙයිමාන්, නිල්ගිරි, නැගෙනහිර සාට්ස්, බටහිර සාට්ස් ආදී කඳු වැටි ඉන්දියාවේ භූගෝලීය පිහිටීම, ආක්‍රමණ ආදිය කෙරෙහි බලපෑ ආකාරය විස්තර කරන්න.

(ii) ඉ.නි.ශි. යේ නාගරික ලක්ෂණ
* නිවාස පද්ධතිය. * ඇතුලු නගරය. * හරප්පාවේ ධාන්‍යාගාරය. * මොහෙන්ජොදාරෝවේ ස්නානාගාරය. * ආලෝකකුලුණු. * රබීගාර්නි විශාල ස්නානාගාරය ආදිය විසින් කරන්න.

(iii) ක්‍රි.පූ. 6 වන සියවසේ උ. ඉන්දියාති රාජධානිය. උතුරු ඉන්දියාවේ බිහි වූ රාජධානි සොලොස් මහා ජනපද නමින් හැඳින්වූ අතර ඒවා නම් කිරීම. ඒවායේ පාලනකටයුතු දෙආකාරයකට සිදුවීම. * රාජාණ්ඩු පාලන ක්‍රමය හා * සමූහාණ්ඩු පාලන ක්‍රමය ලෙස පාලන ක්‍රමයේ ලක්ෂණද විස්තර කරන්න.

(iv) ෂට් ශාස්තෘවරුන් ඃ
ක්‍රි.පූ. හයවන සියවස වන විට ඉන්දියාවේ ආගමික දෘෂ්ඨීන් 62ක් බිහිවූ අතර ඉන් ප්‍රධාන දෘෂ්ඨීන් 6ක් ඉස්මතු වී පෙණිනි. මෙහි ශාස්තෘවරුන් ෂට් ශාස්තෘවරුන් ලෙස හැඳින්විනි. ඔවුන් නම්. * නිගණ්ඨනාථපුත්ත, පූර්ණ කස්සප. * මක්ඛලී ගෝසාල. * අජිත කේසකම්බල. * පකුධ කච්ඡායන. * සංජය බෙල්ලට්ඨිපුත්ත ආදීන් වූ අතර ඔවුන් පිළිබඳ විස්තර කරන්න. (එක් කොටසකට ලකුණු 8 බැගින් ලකුණු 16)